## 03 .රෙදි පිළි අලංකරණය

රෙදි පිළි මුද්‍රණය සඳහා ප්‍රධාන වශයෙන් සායම් වර්ග හා වර්ණ සංකලනය ඉතාම වැදගත් වේ.රෙදි පිළි අලංකරණයේදි සායම් පෙවීම,ආලේපනය හා මුද්‍රණය වැනි ක්‍රමවේදයන් භාවිත කරයි.

සායම් පෙවීම යනු මුළු පෙහෙකම් ද්‍රව්‍යය පුරාම (ගන්නා ලද රෙද්ද පුරාම)වර්ණ පැතිර යාමයි.

සායම් ආලේපනය යනු නිර්මාණය කිරීමට ගන්නා රෙද්දේ නිර්මාණයට අදාල කොටස පමණක් බාහිර උපකරණයක් මගින් සායම් කිරීමයි.

මුද්‍රණය යනු බාහිර උපකරණයන් මඟින් රෙද්ද මත සායම් සහිත මුද්‍රා තැබීමයි.(අච්චුවක්)

අතීතයේදී මිනිසුන් සිතුවම් ඇඳීමට නූල් වර්ණ ගැන්වීමට හා සායම් භාවිතයෙන් සිදු කරනු ලබන ඕනෑම දෙයක් නිර්මාණයට යොදා ගනු ලැබුවේ පරිසරයෙන් ලබා ගත් ද්‍රව්‍යයන්ගෙනි.

වර්ණ සැකසීමට භාවිත කළ අමුද්‍රව්‍යය ලෙස,

- ගස්වල පොතු
- කිරි
- ශාක තෙල් වර්ග
- සත්ත්ව තෙල් වර්ග
- රයිසෝම(අලවර්ග)
- හිරි ගල් පාෂාණ

අතීතයේ වර්ණ ලබා ගැනීමට භාවිත කළ පරිසර සම්පත්

45පිටුවේ වගුව

ස්වාභාවික වර්ණ භාවිත වන අවස්ථා

- සීගිරි බිතු සිතුවම් වල
- සිවුරු පාඩු පෙවීම සඳහා
- මුස්ලිම් කාන්තාවන්ගේ දෑත් දෙපා වර්ණ රටා මගින් අලංකාර කිරීමට භවිත කළ මරතෝන්ඩි
- හින්දු කාන්තාවන් නළලේ තබන කුංකුම සඳහා

  ස්වාභාවික සායම් වර්තමානය වන විට ක්ෂය වෙමින් පවතී. එයට හේතු ලෙස

- වැඩි කාලයක් සැකසීමට ගත වීම
- සායම් නිෂ්පාදන කාලයට පමණක් සීම වීම
- නිෂ්පාදන ප්‍රමාණවත් නොවීම
- සායම් කල්තබා ගැනීමට නොහැකි වීම
- වර්ණ වල ප්‍රබලතා හඳුනා ගත නොහැකි වීම
- ශාක අමුද්‍රව්‍යය යම් කාලයකට පමණක් ලැබීම

  තාක්ෂණයේ දියුණුව සමග වර්ණ කෘතිමව නිෂ්පාදනය කරන ලදී.ඒ අනුව බෝතල් ,ටියුබ්,පැකට්, කුඩු,දියර, කූරු ලෙස වෙළඳපොලෙහි මිලදී ගැනීමට හැකියාව ඇත.